# ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය

# කැලණිය විශ්වවිද්‍යාලය

# වාර්ෂික වාර්තාව 2012

# கம்பஹா விக்ரமாரச்சி ஆயுர்வேத கல்வி நிறுவகம்

# களனிப் பல்கலைக்கழகம்

# 2012 ஆம் ஆண்டுக்கான ஆண்டறிக்கை

**Gampaha Wickramarachchi Ayurveda Institute**

**University of Kelaniya**

**Yakkala**

**Annual Report – 2012**

# වාර්ෂික වාර්තාව 2012

## ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය
## කැලණිය විශ්වවිද්‍යාලය

# වාර්ෂික වාර්තාව
# 2012

## ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය
## කැලණිය විශ්වවිද්‍යාලය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1995 මාර්තු මස 13 වන දින ප්‍රකාශයට පත් කරන ලද අංක 862/8 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24 අ (2) හා 24 (ආ) යටතේ 1995 අංක 01 දරන ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතන නියමාවලිය ප්‍රකාශයට පත් කර තිබේ. එමගින් ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත උසස් අධ්‍යාපන ආයතනයක් ලෙස පිහිටුවා ඇත.

එකී නියමාවලියේ ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී යන අධ්‍යයන වර්ෂ පහකින් සමන්විත උපාධි පාඨමාලාවක් පවත්වාගෙන යාම ප්‍රධාන පරමාර්ථය වී ඇත.

ඒ අනුව 1995 මාර්තු 01 දින සිට උසස් අධ්‍යාපන ආයතනයක් වශයෙන් පවත්වාගෙන යන මෙම ආයතනයේ 2012 වර්ෂය සඳහා වූ ආයතනික කටයුතු හා සංවර්ධනය ඇතුළත් වාර්ෂික වාර්තාව, අවසාන ගිණුම් වාර්තාව හා 2012 වර්ෂය සඳහා මෙම ආයතනය සම්බන්ධයෙන් වූ රජයේ විගණකාධිපති විසින් ලබා දී ඇති වාර්තාව මෙයින් ඉදිරිපත් කරමි.

මහාචාර්ය ජනිතා ඒ ලියනගේ.
අධ්‍යක්ෂ

# ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය
## අධ්‍යක්ෂගේ වාර්තාව

ආයතනයේ දැක්ම හා මෙහෙවර ළඟා කර ගැනීමට සකස් කරන ලද 2012 - 2016 දක්වා වන සංයුක්ත සැලැස්ම මෙම ආයතනයේ 2012.04.19 දින පැවැති 193 වන කළමනාකරණ මණ්ඩලයේ දී අනුමත කර තිබේ.

ඒ අනුව උපාධි අපේක්ෂක සිසුන්ගේ සහ කාර්ය මණ්ඩලයේ කාර්ය සාධනය අගය කළ යුතු මට්ටමකට ළඟා කර ගැනීමට හැකි වූ බව සතුටින් සඳහන් කරමු.

සංයුක්ත සැලැස්මේ අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීමේ දී නොවැළැක්විය හැකි හේතුන් හා අනපේක්ෂිත බාධාවන් නිසා ඇතැම් ඉලක්ක ළඟා කර ගැනීමට අපොහොසත් වූ බව කිව යුතුය.

සංයුක්ත සැලැස්ම සංශෝධනය කර එමගින් සංයුක්ත සැලැස්මේ සඳහන් ඉලක්ක යම් ප්‍රමාණයකින් ළඟා කර ගත හැකි වේ යයි මාගේ විශ්වාසය යි.

මහාචාර්ය ජනිතා ඒ. ලියනගේ.
අධ්‍යක්ෂ.

# පටුන


| | කාරණය | පිටු අංකය |
|---|---|---|
| 01. | ආයතනයේ දැක්ම | 01 |
| 02. | මෙහෙවර ප්‍රකාශය | 02 |
| 03. | අධ්‍යක්ෂතුමියගේ පණිවුඩය | 03 |
| 04. | සම්පත් සහ ශිෂ්‍යයන් පිළිබඳ විස්තර | 04 |
| 05. | දේශීය සිසුන් පිළිබඳ විස්තර | 04 |
| 06. | විදේශීය සිසුන් පිළිබඳ විස්තර | 04 |
| 07. | අධ්‍යයන කාර්ය මණ්ඩලයේ විස්තර | 05 - 06 |
| 08. | අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ විස්තර | 06 |
| 09. | පර්යේෂණ, නව සොයා ගැනීම් සහ ප්‍රකාශන පිළිබඳ විස්තර | 07 |
| 10. | වැඩ සටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු පිළිබඳ විස්තර | 07 |
| 11. | සම්මාන ලැබීම් පිළිබඳ විස්තර | 08 |
| 12. | ආරම්භ කරන ලද නව පාඨමාලාවල විස්තර | 08 |
| 13. | පුනරාවර්තන වියදම් විස්තර | 09 |
| 14. | ප්‍රාග්ධන වියදම් විස්තර | 09 |
| 15. | ව්‍යාපෘති පිළිබඳ විස්තර (දේශීය/විදේශීය මූල්‍ය දායකත්වය) | 09 |

| | | |
|---|---|---|
| 16. | ව්‍යාපෘති වියදම් පිළිබඳ විස්තර (දේශීය/විදේශීය මූල්‍ය දායකත්වය) | 10 |
| 17. | මූල්‍ය තත්ත්වයේ ප්‍රගතිය පිළිබඳ විස්තර (වියදම්) | 10 |
| 18. | මූල්‍ය තත්ත්වයේ ප්‍රගතිය පිළිබඳ විස්තර (අභ්‍යන්තර ආදායම්) | 10 |
| 19. | මූල්‍ය ක්‍රියාකාරිත්ව විශ්ලේෂණය - 2012 | 11 |
| 20. | යටිතල පහසුකම් සඳහා 2012 වර්ෂය තුළ ලැබීම් | 11 |
| 21. | වෙනත් විස්තර | |
| | 21.1 පුස්තකාලය | 11 |
| | 21.2 පරිගණක අංශය | 11 |
| | 21.3 යටිතල පහසුකම් සංවර්ධනය | 11 |
| 22. | අධ්‍යක්ෂ වාර්තාව | 12 |
| 23. | 2012.12.31 දිනට මූල්‍ය තත්ත්වය දැක්වෙන ප්‍රකාශනය | 14 |
| 24. | 2012.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් සහ වියදම් පිළිබඳ ප්‍රකාශනය | 15 |
| 25. | විගණකාධිපති වාර්තාව | 16-23 |
| 26. | විගණකාධිපති වාර්තාවට අදාළ පිළිතුරු | 24-27 |

**1. ආයතනයේ දැක්ම :**

## දැක්ම

කුසලතා පූර්ණ උපාධිධාරීන් බිහි කිරීම මගින් ආයුර්වේද අධ්‍යයන පිළිබඳ විශිෂ්ය මධ්‍යස්ථානය බවට පත් වීම.

**2. මෙහෙවර ප්‍රකාශය :**

## මෙහෙවර

ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ මෙහෙවර වනුයේ, ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රයේ විද්‍යාත්මක දැනුම හා අවබෝධය වර්ධනය කිරීම සහ දැනුම ව්‍යාප්ත කිරීම සඳහා පහත දැක්වෙන අරමුණු හා ක්‍රමවේදයක් ක්‍රියාවට නැංවීම ය.

" මෙම ආයතනයේ අධ්‍යාපනය ලබන සිසුන් හැම අතින් ම සංවර්ධනය කිරීම සඳහා සුදුසු වාතාවරණයක් බිහි කිරීම, ආයුර්වේද වෛද්‍ය අධ්‍යාපනයේ ප්‍රායෝගික සහ පර්යේෂණ දියුණු කිරීම සඳහා සුදුසු පරිසරයක් ගොඩනැගීම, ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ අවශ්‍යතාවන්ට සරිලන නවීන ඉගැන්වීම් සහ පුහුණුවීම් තුළින් දැනුම ළඟා කර ගැනීම පිණිස ප්‍රායෝගික පුහුණුවීම්වලට පදනම් වන පරිසරයක් ගොඩනැගීම, පවත්නා ආයුර්වේද වෛද්‍යවේදී සහ ශල්‍යවේදී උපාධි පාඨමාලාවේ ව්‍යුහාත්මක වෙනසක් ඇති කරමින් ශිෂ්‍ය සංඛ්‍යාව ඉහළ දැමීම සඳහා සැලසුම් සකස් කිරීම, ශ්‍රී ලංකාවේ සහ දේශයෙන් පිටත සෞඛ්‍ය ක්ෂේත්‍ර සම්බන්ධ කටයුතුවල නියැලී සිටින ආයතන සමඟ අන්තර් සම්බන්ධතාවන් ගොඩනැංවීම, අවශ්‍ය සුදුසුකම් හා උනන්දුවක් සහිත මානව සම්පත් කණ්ඩායමක් ආයතනය තුළ බිහි කිරීම "

## 3. අධ්‍යක්ෂතුමියගේ පණිවුඩය :

### අ. හැඳින්වීම

ආයතනයේ දක්ම හා මෙහෙවර ළඟා කර ගැනීමට සකස් කරන ලද 2012 - 2016 දක්වා වන සංයුක්ත සැලැස්ම මෙම ආයතනයේ 2011.04.19 දින පැවැති 193 වන කළමනාකරණ මණ්ඩලය විසින් අනුමත කර තිබේ.

### ආ. ජයග්‍රහණ

උපාධි අපේක්ෂක සිසුන්ගේ සහ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ කාර්ය සාධනය අගය කළ යුතු මට්ටමකට ළඟා කර ගැනීමට හැකි වූ බව සතුටින් සඳහන් කරමු.

### ඇ. අඩුපාඩු

සංයුක්ත සැලැස්මේ අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීමේ දී නොවැළැක්විය හැකි හේතූන් හා අනපේක්ෂිත බාධාවන් නිසා ඇතැම් ඉලක්ක ළඟා කර ගැනීමට අපොහොසත් වූ බව කිව යුතු ය.

### ඈ. අනාගත සැලසුම්

සංයුක්ත සැලැස්ම සංශෝධනය කරනු ලැබූ අතර එමගින් සංයුක්ත සැලැස්මේ සඳහන් ඉලක්ක යම් ප්‍රමාණයකින් ඉදිරි වර්ෂයේ දී ළඟා කර ගත හැකි වේ යයි මාගේ විශ්වාසය යි.

විෂය නිර්දේශ සංශෝධනය කිරීමේ කටයුතු පළමු සහ දෙවන කාර්තුවලදී ක්‍රියාවට නැංවූ අතර 2010/2011 අධ්‍යයන වසරේ ප්‍රථම වසර සිසුන් සඳහා නව විෂය නිර්දේශය අනුව දේශන ආරම්භ කිරීමට හැකි විය.

විද්‍යායතනයට ප්‍රධාන අඩුපාඩුවක්ව පවතින විදුලි ජනක යන්ත්‍රය මිල දී ගැනීම සඳහා මූලික කටයුතු කරනු ලැබූ අතර 2012 වසරේදී නව විදුලි ජනක යන්ත්‍රය ස්ථාපනය කිරීමට හැකි වෙතැයි අපේක්ෂා කරමි.

ආයතනය සඳහා පවතින භූමි ප්‍රමාණය ප්‍රමාණවත් නොවන බැවින් ආයතනය වටා ඇති මුඩුබිම් අත්පත් කර ගැනීම සඳහා කරනු ලැබූ ඉල්ලීමට අදාළ වැඩ කටයුතු කාර්ය ඉටු කර ගන්නා තෙක් ඉදිරියට ගෙන යාමට අපේක්ෂා කරමි.

4. සම්පත් සහ ශිෂ්‍යයන් පිළිබඳ විස්තර :

| ආයතනය | පාඨමාලාව | මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | මුළු අධ්‍යයන කාර්ය මණ්ඩලය | මුළු අනධ්‍යයන කාර්ය මණ්ඩලය |
|---|---|---|---|---|
| ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය | ආයුර්වේද වෛද්‍යවේදී සහ ශල්‍යවේදී උපාධිය | 360 (5 වසර ද ඇතුළත්ව) | | |
| **මුළු ගණන** | | **360** | | |

5. දේශීය සිසුන් පිළිබඳ විස්තර :

| ආයතනය | පාඨමාලාව | මාධ්‍යය | බඳවා ගැනීම 2012 | පළමු වසර සිසුන් | 2 වන වසර සිසුන් | 3 වන වසර සිසුන් | 4 වන වසර සිසුන් | 5 වන වසර සිසුන් | උපාධිය ලබාගත් මුළු ගණන |
|---|---|---|---|---|---|---|---|---|---|
| ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය | B.A.M.S. | ඉංග්‍රීසි | - | 93 | | | | | |
| | | සිංහල | | | 96 | 83 | 51 | | 37 (විභාගය අවසන් කර නැත) |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| **මුළු ගණන** | | | | **93** | **96** | **83** | **51** | | **37** |

6. විදේශීය සිසුන් පිළිබඳ විස්තර :

| ආයතනය | පාඨමාලාව | මාධ්‍යය | බඳවා ගැනීම | පළමු වසර සිසුන් | 2 වන වසර සිසුන් | 3 වන වසර සිසුන් | 4 වන වසර සිසුන් | උපාධිය ලබාගත් මුළු ගණන |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| **මුළු ගණන** | | | | | | | | |

**7. අධ්‍යයන කාර්ය මණ්ඩලයේ විස්තර :**

| ආයතනය | විෂය | මාධ්‍යය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | මහාචාර්ය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | කථිකාචාර්ය | සහකාර කථිකාචාර්ය | උපදේශක - - වරුන් |
|---|---|---|---|---|---|---|---|---|
| ශල්‍ය ශාලක්‍ය | ශල්‍ය | සිංහල<br>ඉංග්‍රීසි | - | - | 01 | - | - | - |
| | ශාලක්‍ය | සිංහල | - | - | 01 | - | - | - |
| කෞමාරභෘත්‍ය හා ස්ත්‍රී රෝග | ස්ත්‍රීරෝග | සිංහල | - | - | 02 | - | 01 | 02 |
| | බාලරෝග | සිංහල | | | | | | |
| | ප්‍රසූත තන්ත්‍ර | සිංහල | | | | | | |
| ද්‍රව්‍යගුණ විඥාන | ද්‍රව්‍යගුණ විඥාන | සිංහල<br>ඉංග්‍රීසි | - | 01 | 04 | - | - | ප්‍රදර්ශක 03 |
| | රස ශාස්ත්‍ර | සිංහල<br>ඉංග්‍රීසි | - | - | 02 | - | - | |
| | භෛෂජ්‍ය කල්පනා | සිංහල<br>ඉංග්‍රීසි | - | - | 02 | - | - | |
| ආයුර්වේද මූලධර්ම | හින්දි<br>ඉංග්‍රීසි<br>සංස්කෘත | ඉංග්‍රීසි<br>සිංහල | -<br>-<br>01 | -<br>-<br>- | -<br>-<br>01 | 01<br>01 | - | |
| | ජ්‍යොතිෂ මූලධර්ම | ඉංග්‍රීසි<br>සිංහල | - | - | - | 02 | | |
| | භූත විද්‍යාව | ඉංග්‍රීසි<br>සිංහල | | | | 01 | | |
| | වෘද්ධත්‍රයි | ඉංග්‍රීසි<br>සිංහල | 01 | | | 02 | | |
| | ශරීර ක්‍රියා නව්‍ය | ඉංග්‍රීසි<br>සිංහල | | | | | 01ආධුනික | ප්‍රදර්ශක 08 |
| | ශරීර රචනා නව්‍ය | ඉංග්‍රීසි<br>සිංහල | | | | | 01 බාහිර<br>01ආධුනික | |
| | ශරීරරචනා ආයුර්වේද | ඉංග්‍රීසි<br>සිංහල | - | | | 01 | | |
| | ශරීර ක්‍රියා ආයුර්වේද | | | | | 01 | | |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | දෝෂධාතුමලවිඥාන | | | | | 02 | - | - |
| චිකිත්සා | රෝග විඥාන | සිංහල | - | - | 01 | | 01ආධුනික | - |
| | කාය චිකිත්සා | | | | 07 | | | |
| | දේශීය චිකිත්සා | | | | | | | |
| | අගද තන්ත්‍ර | | | | | | | |
| | ස්වස්ථවෘත්ත | | | | | | 01ආධුනික තාවකාලි. කථි.02 | ප්‍රදර්ශක 02 |
| **මුළු ගණන** | | | **02** | **01** | **21** | **11** | **08** | **15** |

**8. අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ විස්තර :**

| **ආයතන අංශය/ අංශය** | **විධායක කාර්ය මණ්ඩලය** | **ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික** | **මාණ්ඩලික** | **කණිෂ්ඨ** | **සුළු සේවක** |
|---|---|---|---|---|---|
| චිකිත්සා | - | 02 | 02 | - | 02 |
| ශල්‍ය ශාලක්‍ය | - | 01 | 01 | - | 01 |
| ස්ත්‍රීරෝග හා කෞමාරභෘත්‍ය | - | - | 02 | - | 01 |
| ද්‍රව්‍යගුණ විඥාන | - | - | 03 | 01 | 02 |
| මූලධර්ම + වෛද්‍ය විද්‍යා තාක්ෂණ අංශය | *01 | 01 | 03 | 03 | 01 |
| පාලන | 02 | 02 | 11 | 07 | 03 |
| නඩත්තු | - | 01 | 01 | 04 | 07 |
| විභාග | 01 | 04 | 04 | 01 | 01 |
| ගිණුම් | 02 | 03 | 08 | - | 02 |
| පුස්තකාලය | - | - | 03 | 03 | 01 |
| පරිගණක | - | 02 | 01 | - | 01 |
| **මුළු ගණන** | **06** | **16** | **39** | **19** | **22** |

*** ජ්‍යෙෂ්ඨ කාර්මික නිලධාරී**

**9. පර්යේෂණ, නව සොයා ගැනීම් සහ ප්‍රකාශන පිළිබඳ විස්තර :**

| විෂයය | ප්‍රකාශිත | | මුදල් ඉපයීම් | ඉදිරිපත් කිරීම් |
|---|---|---|---|---|
| අ. පර්යේෂණ ගණන | ශල්‍ය ශාලක්‍ය<br>කෞමාරභෘත්‍ය හා ස්ත්‍රීරෝග<br>මූලධර්ම<br>ද්‍රව්‍යගුණ විඥාන | 04<br>15<br>18 | 01<br>01 | 01<br>02<br>20 |
| ආ. නව සොයා ගැනීම් | කෞමාරභෘත්‍ය හා ස්ත්‍රීරෝග | 01 | | |
| ඇ. සඟරා ගණන | | | | |
| ඈ. පොත් ගණන | කෞමාරභෘත්‍ය හා ස්ත්‍රීරෝග | 01 | | |
| ඉ. ලිපි ගණන | කෞමාරභෘත්‍ය හා ස්ත්‍රීරෝග<br>ද්‍රව්‍යගුණ විඥාන<br>කෞමාරභෘත්‍ය හා ස්ත්‍රීරෝග | 05<br><br>05 | | 02 |
| ඊ. වෙනත් | කෞමාරභෘත්‍ය හා ස්ත්‍රීරෝග (DVD) | 13 | රු. 6000.00 | |
| **මුළු ගණන** | | **62** | | **25** |

**10. වැඩ සටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු පිළිබඳ විස්තර :**

| විෂයය | සහභාගි වූ | සම්පූර්ණ කරන ලද | ඉදිරිපත් කරන ලද |
|---|---|---|---|
| අ. පශ්චාද් උපාධි වැඩසටහන් | | | |
| ශල්‍ය ශාලක්‍ය | - | | |
| චිකිත්සා | 16 | | |
| ආ. පශ්චාද් ඩිප්ලෝමා වැඩසටහන් | | | |
| චිකිත්සා | 05 | | |
| ඇ. උපාධි වැඩසටහන් | | | |
| චිකිත්සා | 06 | - | |
| මූලධර්ම | - | 01 | |
| ඈ. ඩිප්ලෝමා වැඩසටහන් | | | |
| චිකිත්සා | 08 | | |
| ඉ. සහතික පත්‍ර පාඨමාලා වැඩසටහන් | | | |
| කෞමාරභෘත්‍ය හා ස්ත්‍රීරෝග | - | 01 | 03 |
| ද්‍රව්‍යගුණ විඥාන | - | - | - |
| ඊ. වෙනත් | | | |
| කෞමාරභෘත්‍ය හා ස්ත්‍රීරෝග | - | 06 | |
| ද්‍රව්‍යගුණ විඥාන | - | - | |
| මූලධර්ම | 25 | 06 | |
| **මුළු ගණන** | **60** | **14** | **03** |

**11. සම්මාන ලැබීම් පිළිබඳ විස්තර :**

| | **විෂයය** | **සම්මාන ගණන** | **අධ්‍යයන කාර්ය මණ්ඩලය** | **සිසුන් ගණන** |
|---|---|---|---|---|
| අ. දේශීය සම්මාන | ශල්‍ය ශාලක්‍ය<br>ද්‍රව්‍යගුණ විඥාන | 01 | ✓ | |
| ආ. ජාතික සම්මාන | කෞමාරභෘත්‍ය හා ස්ත්‍රීරෝග | | | |
| ඇ. ජාත්‍යන්තර සම්මාන | ශල්‍ය ශාලක්‍ය<br><br>කෞමාරභෘත්‍ය හා ස්ත්‍රීරෝග | 01 | ✓ | |
| ඈ. වෙනත් | | | | |
| **මුළු ගණන** | | 02 | | |

**12. ආරම්භ කරන ලද නව පාඨමාලාවල විස්තර :**

| **අධ්‍යයනාංශය** | **පාඨමාලාව** | **මාධ්‍යය** | **සහතික පත්‍ර** | **ඩිප්ලෝමා** | **පශ්චාද් ඩිප්ලෝමා** | **පශ්චාද් උපාධි** | **දර්ශනපති** | **දර්ශනශූරී** |
|---|---|---|---|---|---|---|---|---|
| ශල්‍ය ශාලක්‍ය | යෝග | | | ✓ | | | | |
| කෞමාරභෘත්‍ය හා ස්ත්‍රීරෝග | | | | | | | | |
| ද්‍රව්‍යගුණ විඥාන | | | | | | | | |
| පශ්චාත් උපාධි අංශය | | | | | | | | |
| **මුළු ගණන** | | | | | | | | |

## 13. පුනරාවර්තන වියදම් විස්තර :

| විෂයය | 2011 | 2012 |
|---|---|---|
| අ. පුද්ගල පඩිනඩි | 95,133,199 | 103,904,513 |
| ආ. ගමන් වියදම් | 189,848 | 191,069 |
| ඇ. සැපයුම් | 5,527,468 | 6,738,429 |
| ඈ. නඩත්තු | 2,957,349 | 2,957,210 |
| ඉ. ගිණුම්ගත සේවා | 16,590,316 | 21,714,708 |
| ඊ. වෙනත් | 4,928,760 | 4,570,415 |
| **මුළු ගණන** | **125,326,940** | **140,076,344** |

## 14. ප්‍රාග්ධන වියදම් විස්තර :

| විෂයය | 2011 | 2012 |
|---|---|---|
| ප්‍රාග්ධන වත්කම් වැඩි දියුණු කිරීම | 2,670,506 | 5,020,467 |
| වත්කම් මිල දී ගැනීම් | 7,379,375 | 9,147,244 |
| ඉදිකිරීම් | 92,979,290 | 32,758,339 |
| වෙනත් | - | 3,272,038 |
| **මුළු ගණන** | **103,029,171** | **50,198,088** |

## 15. ව්‍යාපෘති පිළිබඳ විස්තර (දේශීය/විදේශීය මූල්‍ය දායකත්වය) :

| නම සහ විස්තර | ණය/ආධාර | ආධාර දෙන ආයතනය | මුළු පිරිවැය | අරමුදල් ලැබීම් | % ප්‍රමාණය |
|---|---|---|---|---|---|
| වෛද්‍ය බන්දුල වීරසූරිය මයා | 700,000.00 | NCAS | 699,992.24 | 700,000.00 | 100 |
| වෛද්‍ය ඩබ්.ජී.එල්. චන්ද්‍රසිරි මයා | 687,150.00 | NCAS | 528,351.28 | 687,150.00 | 77 |
| වෛද්‍ය එස්.එම්.එස්. සමරකෝන් මයා | 287,470.79 | NCAS | 219,747.79 | 287,470.79 | 76 |
| කේ.එම්. චන්දිමාල් මයා | 250,000.00 | U.G.C. Research Fund | 250,000.00 | 250,000.00 | 100 |
| වෛද්‍ය තිස්ස හේවාවිතාන මයා | 382,140.00 | U.G.C. Research Fund | 382,140,00 | 382,140.00 | 100 |
| වෛද්‍ය එච්.එස්. සකුන්තලා මිය | 250,000.00 | U.G.C. Research Fund | 225,295.04 | 250,000.00 | 90 |
| වෛද්‍ය රූපා මදනායක මෙවි | 250,000.00 | U.G.C. Research Fund | 221,918.91 | 250,000.00 | 89 |
| වෛද්‍ය ජී.ජී.ජේ. පුෂ්පකුමාර මයා | 250,000.00 | U.G.C. Research Fund | 250,000.00 | 250,000.00 | 100 |
| වෛද්‍ය ජේ.එම්.පී.ආර්.කේ. ජයසිංහ මිය | 250,000.00 | U.G.C. Research Fund | 212,177,58 | 250,000.00 | 85 |
| වෛද්‍ය ජේ.ඒ.ඩී.පී.පී. ජයකොඩි මෙවි | 250,000.00 | U.G.C. Research Fund | 249,442.86 | 250,000.00 | 100 |
| වෛද්‍ය එච්.පී. වක්කුඹුර මිය | 250,000.00 | U.G.C. Research Fund | 250,000.00 | 250,000.00 | 100 |
| එස්.ඒ.ආර්.පී. දිසානායක මයා | 55,000.00 | U.G.C. Research Fund | 55,000.00 | 55,000.00 | 100 |
| මුළු ගණන | 3,861,760.79 | | 3,544.065.70 | 3,861,760.79 | |

16. ව්‍යාපෘති වියදම් පිළිබඳ විස්තර : (දේශීය විදේශීය මූල්‍ය දායකත්වය)

| නම | මුළු පිරිවැය | වියදම් 2011 | වියදම් 2012 | සමුච්චිත වියදම් 2012.12.31 දිනට | ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|
| වෛද්‍ය බන්දුල වීරසූරිය මයා | 655,092.24 | 44,900.00 | - | 699,992.24 | 100 |
| වෛද්‍ය ඩබ්.ඒ.එල්. චන්ද්‍රසිරි මයා | 528,351.28 | - | - | 528,351.28 | 77 |
| වෛද්‍ය එස්.එම්.එස්. සමරකෝන් මයා | 219,747.79 | - | - | 219,747.79 | 76 |
| කේ.එම්. චන්දිමාල් මයා | 64,322.80 | 185,677.20 | - | 250,000.00 | 100 |
| වෛද්‍ය තිස්ස හේවාවිතාන මයා | 223,591.00 | 158,549.00 | - | 382,140.00 | 100 |
| වෛද්‍ය එච්.එස්. සකුන්තලා මිය | 213,849.90 | 44,445.14 | - | 225,295.04 | 90 |
| වෛද්‍ය රූපා මදනායක මෙවි | 200,256.00 | 21,662.91 | - | 221,918.91 | 89 |
| වෛද්‍ය ඒ.ඒ.ජේ. පුෂ්පකුමාර මයා | 23,724.65 | 207,882.73 | 18,392.62 | 250,000.00 | 100 |
| වෛද්‍ය ජේ.එම්.පී.ආර්.කේ. ජයසිංහ මිය | 44,055.38 | 95,522.20 | 72,600.00 | 212,177.58 | 50 |
| වෛද්‍ය ජේ.ඒ.ඩී.පී.පී. ජයකොඩි මෙවි | 14,500.00 | 221,942.86 | 13,000.00 | 249,442.86 | 100 |
| වෛද්‍ය එච්.පී. වක්කුඹුර මිය | 41,868.25 | 207,938.68 | 193.15 | 250,000.00 | 100 |
| එස්.ඒ.ආර්.පී. දිසානායක මයා | 12,000.00 | - | 43,000.00 | 55,000.00 | 100 |
| මුළු ගණන | 2,351,323.29 | 2351323.29 | 147185.77 | 3544065.70 | |

17. මූල්‍ය තත්ත්වයේ ප්‍රගතිය පිළිබඳ විස්තර (වියදම්) :

| විෂයය | 2012 ප්‍රතිපාදන | 2012 වියදම් | ඉතිරි/ඉක්මයාම (සීමාව ඉක්මවීම) |
|---|---|---|---|
| අ. පුනරාවර්තන | 127,600.000.00 | 140,076,344.00 | |
| ආ. ප්‍රාග්ධන | 25,660,000.00 | 50,198,088.00 | 2011 වර්ෂයේ ඉතිරි ප්‍රතිපාදන වැයකර ඇත. |
| ඇ. ව්‍යාපෘති - දේශීය ආධාර | - | - | |
| ඈ. ව්‍යාපෘති - විදේශ ආධාර | - | - | |
| **මුළු ගණන** | **153260000.00** | **190274432.00** | |

18. මූල්‍ය තත්ත්වයේ ප්‍රගතිය පිළිබඳ විස්තර (අභ්‍යන්තර ආදායම) :

| ආදායම් ප්‍රභවය | ප්‍රතිපාදන/වෙන්කිරීම් ඇස්තමේන්තු | ලැබීම් 2012 | අඩු/වැඩි |
|---|---|---|---|
| අ. උපාධි අපේක්ෂක | 4,731,000.00 | 6,496,711.00 | - |
| ආ. පශ්චාද් උපාධි | - | - | - |
| ඇ. උපදේශක | - | - | - |
| ඈ. වෙනත් - පාඨමාලා මුදල් | 4,860,000.00 | 9,283,946.00 | - |
| **මුළු ගණන** | **9,591,000.00** | **15,780,657.00** | - |

19. මූල්‍ය ක්‍රියාකාරිත්ව විශ්ලේෂණය - 2012 :

| විෂයය | සංකේතය | ඒක ශිෂ්‍ය පිරිවැය |
|---|---|---|
| අ. ඒක ශිෂ්‍ය පිරිවැය පුනරාවර්තන වියදම් (පු.වි)<br>පු.වි/ශිෂ්‍ය සංඛ්‍යාව | - | 384,825.00 |
| ආ. ඒක ශිෂ්‍ය පිරිවැය ප්‍රාග්ධන වියදම් (පු.වි)<br>පු.වි/ශිෂ්‍ය සංඛ්‍යාව | - | 137,907.00 |
| **මුළු ගණන** | **-** | **522732.00** |

20. යටිතල පහසුකම් සඳහා 2012 වර්ෂය තුළ ලැබීම් :

| යටිතල පහසුකම් පිළිබඳ විස්තර | වියදම් | ප්‍රගතිය |
|---|---|---|
| 1. වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම් | 5,020,467 | 75% |
| 2. ඉදිකිරීම් | 32,758,339.00 | 100% |
| **මුළු ගණන** | **37778806.00** | |

21. වෙනත් විස්තර (වාර්තාවට අදාළ) :

21.1 පුස්තකාලය

2012 වර්ෂයේ පොත් ප්‍රතිග්‍රහණය කර ගැනීමේ සාරාංශය

| විස්තරය | මිල දී ගැනීම | පරිත්‍යාග | එකතුව |
|---|---|---|---|
| පොත් | 497 | 1031 | 1528 |
| වාරික ප්‍රකාශන | - | - | - |
| පුවත්පත් | - | - | - |

21.2 පරිගණක අංශය

පරිගණක අංශයේ කටයුතු සාර්ථකව මෙම වර්ෂය තුළ ද පවත්වාගෙන යාමට හැකි වූ අතර, ප්‍රමාණවත් සේවාවක් සිසුන්ට සහ කාර්ය මණ්ඩලයට ලබා දීමට හැකි විය.

21.3 යටිතල පහසුකම් සංවර්ධනය

භෛෂජ්‍ය ගොඩනැගිල්ල, පරිපාලන ගොඩනැගිල්ල සහ අධ්‍යයනාංශ ගොඩනැගිලි ඉදි කිරීමට අදාළ උපදේශක සේවා ආරම්භ කර ඇත.

## අධ්‍යක්ෂ වාර්තාව

1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ දැක්වෙන විධිවිධාන යටතේ කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධ ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ 2012 වර්ෂයට අදාල මූල්‍ය කටයුතු පිළිබඳ වාර්තාව.

2012 වර්ෂය සඳහා ආයතනයට මහා භාණ්ඩාගාරය විසින් නිදහස් කර ඇති ආධාර මුදල් පහත පරිදි වේ.

**පුනරාවර්තන ආධාර**

| | | |
|---|---|---|
| | | (රු. මිලියන) |
| රජයේ ඇස්තමේන්තු මගින් ලද ආධාර | - | 127.60 |
| අනෙකුත් පුනරාවර්තන ආදායම | - | 15.78 |
| | - | 143.38 |

**එකතු කළා**

| | | | |
|---|---|---|---|
| ක්‍රමක්ෂය | ප්‍රාග්ධන | - | 19.74 |
| මුළු එකතුව (පුනරාවර්තන) | | - | 163.12 |
| **මූලධන ආධාර** | | - | 25.66 |

| | | | | | |
|---|---|---|---|---|---|
| වැය ශිර්ෂ | 101 | - | පුරුත්ථාපන සහ නඩත්තු කටයුතු | - | 5.00 |
| වැය ශීර්ෂය | 102 | - | භාණ්ඩ, උපකරණ, පුස්තකාල | - | 9.15 |
| | | - | පොත් හා වාර සඟරා අත්පත් කර ගැනීම | | |
| වැය ශීර්ෂය | 103 | - | ගොඩනැගිලි ඉදි කිරීම් | - | 32.76 |
| | | | දැනුම වර්ධනය හා ආයතනික ප්‍රවර්ධන කටයුතු | - | 3.28 |
| මුළු එකතුව (ප්‍රාග්ධන) | | | | | 50.19 |

**ආදායම**

2012 ගිණුම් වර්ෂය තුළ පුනරාවර්තන ආධාර ලෙස රජයෙන් ලැබුණු මුදල රු. 127,600,000 කි.

විද්‍යායතනය මගින් වර්ෂය තුළ දී අතිකුත් පුනරාවර්තන ආදායම් මාර්ග වලින් ලබා ගත් මුදල රු. 15,780,657 කි. ඒ අනුව මුළු ආදායම රු.143,380,657 කි.

**වියදම**

2012 වර්ෂය සඳහා මුළු පුනරාවර්තන වියදම රු.168,611,950 ක් විය. මේ අනුව වර්ෂයේ ආදායමට වඩා වැඩියෙන් දරා ඇති වියදම රු.5,483,665 කි.

**ස්ථාවර වත්කම් ක්ෂය කිරීම**

ආයතනයේ ස්ථාවර වත්කම් ක්ෂය කිරීම වෙනුවෙන් 2012 වර්ෂය තුළ රු. 19,747,628 වෙන් කර ඇත.

**ප්‍රාග්ධන සේවා මූලධන ප්‍රතිඵලය**

**වැය ශීර්ෂ 101 - පුනරුත්ථාපන සහ නඩත්තු කටයුතු**

පුනරුත්ථාපන සහ නඩත්තු වැය ශීර්ෂ (101) ලැබුණු ප්‍රතිපාදිත මුදල රු. 6,700,000 ක් වන අතර, එමගින් 2012 වර්ෂය දරා ඇති මුළු වියදම රු. 5,020,466 කි.

**වැය ශීර්ෂ අංක 102 - භාණ්ඩ අත්පත් කර ගැනීම**

වත්කම් අත්පත් කර ගැනීමේ වැය ශීර්ෂ (102) සඳහා ලැබුණු ප්‍රතිපදාන මුදල රු.4,210,000 ක් වන අතර, ඒ සඳහා දරණ ලද මුළු වියදම ගැලපීම් සහිතව රු. 9,147,243.94 කි.

**වැය ශීර්ෂ අංක 103 - ඉදි කිරීම් කටයුතු**

ඉදි කිරීම් වැය ශීර්ෂය (103) සඳහා ලැබුණු ප්‍රතිපාදන මුදල රු. 11,100,000/- ක් වන අතර, එහි ගැලපීම් සමඟ දරණ ලද මුළු වියදම රු. 32,758,339.36 කි.

**දැනුම වර්ධනය හා ආයතනික ප්‍රවර්ධනය**

දැනුම වර්ධනය කිරීම සහ ආයතනික සංවර්ධන ව්‍යාපෘති වැය ශීර්ෂය සඳහා ප්‍රතිපාදිත මුදල රු. 3,650,000/- ක් වන අතර, 2012 වර්ෂයේ එහි වැය වූ මුළු වියදම රු. 3,272,038.01 කි.

මහාචාර්ය ජනිතා ඒ. ලියනගේ
අධ්‍යක්ෂ

2012.12.31 දිනට මූල්‍ය තත්වය දැක්වෙන ප්‍රකාශනය

| | 2012 | | 2011 | |
|---|---|---|---|---|
| | **Rs.** | **Rs.** | **Rs.** | **Rs.** |
| **වත්කම්** | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | |
| (අ) ඉඩම් | 72,126,250 | | 72,076,250 | |
| (ආ) ගොඩනැගිලි | 163,083,528 | | 94,597,077 | |
| (ඇ) කාර්යාල උපකරණ | 4,642,250 | | 17,480,430 | |
| (ඈ) රසායනාගාර හා අධ්‍ය උපකරණ | 23,858,556 | | 18,479,240 | |
| (ඉ) ලී බඩු හා සවි කිරීම් | 16,170,147 | | 11,889,987 | |
| (ඊ) පුස්තකාල පොත් සහ සඟරා | 6,177,639 | | 8,173,590 | |
| (උ) මෝටර් රථ වාහන | 7,031,497 | | 9,254,799 | |
| (ඌ) යන්ත්‍රෝපකරණ | 3,695,535 | 296,785,401 | 1,495,026 | 233,446,399 |
| (එ) වෙනත් | | 1,361,857 | | 1,614,356 |
| (ඒ) නිම නොවූ වැඩ | | 66,439,561 | | 102,426,246 |
| (ඔ) මූලධන අත්තිකාරම් | | 6,003,579 | | 8,994,661 |
| **ආයෝජන** | | | | |
| **ස්ථාවර තැන්පත්** | | 49,554,753 | | 21,929,511 |
| | | **420,145,150** | | **368,411,173** |
| **ජංගම වත්කම්** | | | | |
| (අ) ගබඩා අත්තිකාරම් | 2,141,600 | | 1,765,401 | |
| (ආ) ණය ගැතියෝ | 1,899,540 | | 1,497,840 | |
| (ඇ) ණය සහ අත්තිකාරම් | 20,060,331 | | 19,715,790 | |
| (ඈ) මිශ්‍ර අත්තිකාරම් | 6,000 | | 173,529 | |
| (ඉ) පර්යේෂණ අත්තිකාරම් | - | | 41,500 | |
| (ඊ) පෙර ගෙවීම | 10,287 | | 164,560 | |
| (උ) බැංකු ශේෂය | 19,564,634 | | 73,197,699 | |
| (ඌ) බැංකු ශේෂය ( බාහිර පාඨමාලා) | 5,860,067 | | 275,770 | |
| (එ) සුළු මුදල් ශේෂය | 180 | | 180 | |
| (ඒ) වෙනත් වත්කම් | 4,451,894 | 53,994,532 | 1,637,710 | 98,469,979 |
| **මුළු වත්කම්** | | 474,139,682 | | 466,881,152 |
| **වගකීම්** | | | | |
| (අ) ජංගම වගකීම් | 440,310 | | 282,750 | |
| (ආ) ගෙවීම් | 20,370,454 | | 17,114,279 | |
| (ඇ) උපචිත වියදම් | 1,596,156 | 22,406,920 | 2,548,782 | 19,945,811 |
| **ජංගම නොවන වගකීම්** | | | | |
| (අ) පාරිතෝෂික දීමනා වෙන් කිරීම් | | 37,599,840 | | 33,751,935 |
| මුළු වගකීම් | | 60,006,759 | | 53,697,746 |
| මුළු ශුද්ධ වත්කම්/හිමිකම් | | 414,132,923 | | 413,183,406 |
| ශුද්ධ වත්කම්/හිමිකම් | | | | |
| (අ) වැය කළ ප්‍රාග්ධනය | 242,277,765 | | 215,099,344 | |
| (ආ) වැය නොකළ ප්‍රාග්ධනය | 18,359,914 | | 42,898,001 | |
| (ඇ) අරමුදල | (17,698,629) | | (14,356,181) | |
| (ඈ) විශේෂ කටයුතු සඳහා වූ ප්‍රදාන | 171,193,873 | | 169,542,242 | |
| මුළු ශුද්ධ වත්කම්/හිමිකම් | | 414,132,923 | | 413,183,406 |

මහාචාර්ය ජනිතා ඒ. ලියනගේ
අධ්‍යක්ෂ

ඩබ්.ඒ.පී.එස්. මොලගොඩ
නියෝජ්‍ය මූල්‍යාධිකාරී

## 2012.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ

## ආදායම් සහ වියදම් පිළිබඳ ප්‍රකාශනය

| | 2012<br>රු. | රු. | 2011<br>රු. | රු. |
|---|---|---|---|---|
| **මෙහෙයුම් ආදායම්** | | | | |
| පුනරාවර්තන ආධාර | | 127,600,000 | | 111,099,108 |
| ක්‍රමක්ෂය | | 19,747,628 | | 15,132,899 |
| වෙනත් ආදායම් | | | | |
| (1) ණය සහ අත්තිකාරම් පොලී | 671,479 | | 759,447 | |
| (2) විවිධ ලැබීම් | 322,777 | | 2,530,119 | |
| (3) පොලී ආදායම | 5,169,263 | | 880,624 | |
| (4) ශිෂ්‍ය ලියාපදිංචි ගාස්තු | 36,015 | | 111,875 | |
| (5) විභාග ගාස්තු | 20,650 | | 4,050 | |
| (6) පුස්තකාල දඩ මුදල් | 39,420 | | 69,904 | |
| (7) වෛද්‍ය ගාස්තු | 24,660 | | 18,060 | |
| (8) දේපල වලින් වූ කුලී ආදායම් | 210,728 | | 318,855 | |
| (9) ප්‍රකාශන විකුණුම් | 500 | | - | |
| (10) පැරණි භාණ්ඩ විකුණුම් (රථ වාහන) | 1,219 | | - | |
| (11) සම්බන්ධීකාරක ක්‍රියාකාරකම් | - | | - | |
| (12) බාහිර පාඨමාලා ආදායම් | 9,283,946 | | 4,855,636 | |
| | | 15,780,657 | | 9,548,570 |
| | | **163,128,285** | | **135,780,577** |
| **මෙහෙයුම් වියදම්** | | | | |
| පුද්ගල පඩිනඩි | 103,904,513 | | 95,133,199 | |
| ගමන් වියදම් | 191,069 | | 189,848 | |
| සැපයීම | 6,738,429 | | 5,527,468 | |
| නඩත්තු | 2,957,210 | | 2,957,349 | |
| ගිවිසුම් ගත සේවා | 21,714,708 | | 16,590,316 | |
| පර්යේෂණ සහ සංවර්ධන | 450,846 | | 263,132 | |
| ක්ෂය වීම් | 19,747,628 | | 15,132,899 | |
| වෙනත් මෙහෙයුම් වියදම් | 4,119,569 | | 4,665,628 | |
| පාඨමාලා වියදම් | 8,787,978 | | 4,855,636 | |
| මුළු මෙහෙයුම් වියදම් | | **168,611,950** | | **145,315,475** |
| මෙහෙයුම් කටයුතු වලින් ජනිත වූ අතිරික්තය (ඌනතාවය) | | **(5,483,665)** | | **(9,534,898)** |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல / My No: ඊසී/එෆ්/ ජඩබ්ලිව්ඒඅයි /එෆ්ඒ/2012
ඔබේ අංකය / உமது இல / Your No.:
දිනය / திகதி / Date: 2013 සැප්තැම්බර් 26 දින

අධ්‍යක්ෂ,
ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය.

**කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (1) උපවගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය , මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වන වගන්තිය යටතේ පනවා ඇති 1995 අංක 1 දරන ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතන නියමාවලියේ 19 වන වගන්තිය හා විශ්වවිද්‍යාල පනතේ 107 (5) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාරව විද්‍යායතනයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ . විශ්ව විද්‍යාල පනතේ 108(2) උපවගන්තිය ප්‍රකාරව විස්තරාත්මක වාර්තාවක් විද්‍යායතනයේ අධ්‍යක්ෂවරයා වෙත 2013 මැයි 31 දින නිකුත් කරන ලදී.

### 1.2 <u>මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම</u>

මෙම මූල්‍ය ප්‍රකාශන රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 <u>විගණකගේ වගකීම</u>

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

අංක 306/72 පොල්දුව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka
දුරකථනය / தொலைபேசி / Telephone: 2887028 -34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No.: 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail.: oaggov@sltnet.lk

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාර වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත්වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරුකිරීමද, ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස විද්‍යායතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විද්‍යායතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත්වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාර බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර , මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

වර්ෂය තුළ විශේෂ පරිත්‍යාග ලෙස 21 වන සියවසට උසස් අධ්‍යාපන ව්‍යාපෘති (HETC) අරමුදලින් රු.719,557 ක් වටිනා පොත් 999 ක් පුස්තකාලයට පරිත්‍යාග කර තිබුණ ද එම වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි.

## 2.2.2 නොසැසඳු පාලන ගිණුම්

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) උපලේඛන අනුව යන්ත්‍ර උපකරණ වල අත්පත්කර ගැනිම්වල වටිනාකම රු.865,890 ක් වී තිබුණත් එම වත්කම් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු රු.73,748,992 ක් වූ ගොඩනැගිලිවල අත්පත්කර ගැනිම්වල වටිනාකම සඳහා උපලේඛණ ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ආපදා ණය, වාහන ණය ,පරිගණක ණය හා අනෙකුත් සේවක ණයවලට අදාලව ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන ණය ලේඛනය හා පොදු ලෙජරයේ වර්ෂයේ ආරම්භක හා අවසාන ශේෂවල පහත පරිදි වෙනස්කම් තිබුණි.

| විස්තරය | පොදු ලෙජරය අනුව ශේෂය | | ණය ලේඛණය අනුව ශේෂය | | වෙනස | |
|---|---|---|---|---|---|---|
| ________ | ආරම්භක | අවසාන | ආරම්භක | අවසාන | ආරම්භක | අවසාන |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වාහන ණය | 35,667 | 1,277,714 | 1,763,115 | 1,458,048 | 1,727,448 | 180,334 |
| පරිගණක ණය | 1,129,500 | 1,240,000 | 1,063,500 | 1,228,000 | 66,000 | 12,000 |
| ආපදා ණය | 15,754,317 | 16,094,073 | 14,365,870 | 15,916,952 | 1,388,447 | 177,121 |
| විශේෂ ආපදා ණය | 392,572 | 103,020 | 392,572 | 980,252 | - | 877,232 |
| සේවක ණය | 282,880 | 9,650 | 293,590 | 341,150 | 10,710 | 331,500 |

## 2.2.3 ගෙවිය යුතු ගිණුම්

2012 දෙසැම්බර් 31 දින වන විට රඳවා ගැනීම් රු.5,281,364 ක්ද , විවිධ ඇප තැන්පත් රු.175,250 ක් හා නොගෙවූ වව්චර් තැන්පත් රු.22,450 ක්ද වශයෙන් එකතුව රු.5,479,064 ක් වූ බැරකම් වර්ෂ 1 සිට වර්ෂ 5 ක් දක්වා වූ කාල පරාසයක සිට පැවක එන නමුත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

2012 දෙසැම්බර් 31 දිනට කෙරීගෙන යන ඉදිකිරීම් කර්මාන්ත ලෙස රු.66,439,561 ක් ශේෂපත්‍රයේ දැක්වෙන අතර,එක්නෙක කොන්ත්‍රාත් වල කෙරීගෙන යන වැඩ වටිනාකම එහි ආරම්භක ශේෂය හා ප්‍රාග්ධනගත කිරීම් පැහැදිලිව හදුනාගත හැකි පරිදි වෙන්ව ලෙජර් ගිණුම් හෝ උපලේඛන සකස් කර නොතිබුණි.

2.2.5 **නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| **නීති,රීති,රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| (අ) මුදල් රෙගුලාසි 104(2) | 2011 අගෝස්තු 12 දින අනතුරට ලක්ව තිබූ වාහනයක් සම්බන්ධව මූලික පරීක්ෂණ වාර්තා විගණකාධිපතිට එවා නොතිබුණි. |
| (ආ) 1994 ජූනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | ගාස්තු අයකරන පාඨමාලා 05 ක් සංවිධානය කිරීම වෙනුවෙන් අධ්‍යයන හා අනධ්‍යයන කාර්යමණ්ඩලයට අනුමැතියකින් තොරව සාමාන්‍ය රාජකාරී වේලාව තුළදී හා සති අන්ත රාජකාරී සඳහා රු.8,787,108 ක් විවිධ දීමනාවන් හා ගාස්තු වශයෙන් ගෙවා තිබුණි. |
| (ඇ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය | මූල්‍ය ප්‍රකාශන සමග කෙටුම්පත් වාර්ෂික වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඈ) 2011 අප්‍රේල් 07 දිනැති අංක 45 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය | 2012 වර්ෂයේ පර්යේෂණ දීමනා වශයෙන් නිලධාරීන් 30 දෙනෙකුට රු. 3,914,230 ක් වියදම් කර තිබූ අතර නියමිත පරිදි වාර්තා නිලධාරීන් 18 දෙනෙකු පමණක් ඉදිරිපත් කර තිබුණි. |

3. **මූල්‍ය සමාලෝචනය**

3.1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විද්‍යායතනයේ වැඩකටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර රු.133,083,665 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.120,634,006 ක් විය. සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලැබුණු රු.127,600,000 ක ප්‍රදාන හේතුවෙන් ඌනතාවය රු.5,483,665 ක් දක්වා අඩුවී තිබූ අතර ඉකුත් වර්ෂය වෙනුවෙන් පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලැබුණු රු. 111,099,108 ක ප්‍රදානය හේතුකොට ගෙන එම වර්ෂයේ ඌනතාවය රු. 9,534,898 ක් දක්වා අඩුවී තිබුණි.

පෙර වර්ෂය සමග සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී විද්‍යායතනයේ ඌනතාවය රු. 4,051,233 කින් අඩු වීමට පුනරාවර්තන වියදම් සඳහා වූ රජයේ ප්‍රදානය රු.16,500,892 කින් හා පොලී ආදායම රු.4,288,639 කින් වැඩිවීම විශේෂයෙන් බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 අධ්‍යයන කාර්ය සාධනය

විද්‍යායතනයේ ආයුර්වේද වෛද්‍යවේදී හා ශෛල්‍යවේදී පස් අවුරුදු උපාධි පාඨමාලාව පමණක් පවත්වා තිබුණු අතර, පසුගිය වර්ෂ දහයක කාලය තුළ ලියාපදිංචි වී සිටි ශිෂ්‍යයින් 394 කින් ශිෂ්‍යයන් 38 දෙනෙකු පාඨමාලා අතහැරගොස් තිබුණි. ශිෂ්‍යයන් 265 දෙනෙකු වර්ෂ අවසාන විභාගවලට පෙනී සිට ඇති අතර ඉන් සිසුන් 219 ක් සමත් වී තිබුණි.

මේ අනුව 2001/2002 අධ්‍යයන වර්ෂයේ සිට 2009/2010 අධ්‍යයන වර්ෂය දක්වා ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සියයට 02 ත් සියයට 41 ත් අතර පරාසයක සිසුන් පාඨමාලා අතහැරගොස් තිබුණු අතර 2010/2011 අධ්‍යයන වර්ෂයට එය සියයට10 ක් වී තිබුණි.

### 4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

**ගාස්තු අයකර පවත්වනු ලබන පාඨමාලා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අනුමත කර නොගත් නිර්ණායකයක් පදනම් කරගෙන ගෙවීම් කිරීමට අමතරව නිර්ණායකය තුළ සඳහන් ව නොමැති දීමනාවක් වූ මසකට රු.1,000 බැගින් වූ සන්නිවේදන දීමනා ඇතැම් පාඨමාලා සමායෝජකවරු වෙත ගෙවා තිබුණි. 2012 වර්ෂය සඳහා එසේ ගෙවා තිබූ මුදල රු.30,000 ක් වී තිබුණි.

(ආ) විද්‍යායතනය විසින් සකස් කර ඇති නිර්ණායකයේ 6.7 වගන්තිය අනුව පාඨමාලාවන් සංවිධානය කිරීම සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩලයට ගෙවීම් කිරීමේ දී රජයේ නිවාඩු දින කරනු ලබන සේවා වෙනුවෙන් දිනකට රු.5,000 ක උපරිමයකට යටත්ව පැමිණෙන දිනකට ගෙවිය හැකි වුවත් , රු.3,000 ත් රු.5,000 ත් අතර පරාසයක දිනකට පාඨමාලා 04 කින් ගෙවීම්කර තිබුණි. ඒ අනුව භාණ්ඩාගාර අනුමැතියකින් තොරව අභ්‍යන්තර කමිටුවක් විසින් සකස් කරන ලද නිර්ණායකයට ද පටහැනිව රු.281,000 ක් වැඩිපුර ගෙවා තිබුණි.

### 4.3 ආර්ථික නොවූ ගනුදෙනු

2010 සැප්තැම්බර් 28 දින ආයතනය විසින් රැහැන් රහිත සෘජු හා අභ්‍යන්තර දුරකථන පද්ධතියක් ටෙලිකොම් ආයතනයෙන් මිලදී ගැනීම සඳහා රු.277,140 ක් ගෙවීම් කර තිබුණු අතර පද්ධතියේ තිබූ දුර්වලතා හේතුවෙන් යහපත් සන්නිවේදනයක් ලබා ගැනීමට නොහැකි වී තිබුණි. එහෙයින් නොමිලේ PABX පද්ධතියක් සැපයීමට ටෙලිකොම් ආයතනය එකඟ වුවත් ලබා දී තිබුණු දුරකථන නැවත ලබා නොදීම නිසා මාසික බදු මුදල හා බිල් පත් වල වටිනාකම රු.176,805 ක් නොගෙවීම හේතුවෙන් PABX පද්ධතිය ලබා දීම මගහැර තිබුණි.

4.4 **හඳුනා ගන්නා ලද පාඩු**

**භාර නොදුන් පුස්තකාල පොත්**

2012 දෙසැම්බර් 31 දිනට අධ්‍යයන කාර්ය මණ්ඩලය හා සිසුන් 74 දෙනෙකු ගෙන ගොස් 2013 ජූනි 28 දින තෙක් ආපසු භාරනොදුන් රු.30,090 ක් වටිනා පුස්තකාල පොත් 127 ක් වූ අතර අයකරගත යුතු මුදල රු. 113,526 ක් විය.මෙම පොත් හෝ මුදල් නැවත ලබාගැනීම හෝ පුස්තකාල තැන්පතු වලින් අයකර ගැනීම සම්බන්ධයෙන් ඵලදායි ක්‍රියාමාර්ගයක් අනුගමනය කර නොතිබුණි.

4.5 **විධිමත් පරිදි පවරා නොගත් ඉඩම්**

පහත සදහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වතුපිටිවල පිහිටි අක්. 05, රූඩ්. 03,පර්. 21. 32 ක ඖෂධ උද්‍යානය ආයතනය විසින් පරිහරණයට ගනු ලැබුවද , එහි නිරවුල් අයිතිය ලබා ගෙන නොතිබුණි.

(ආ) 2002 අගෝස්තු 21 දින ඉඩම් අමාත්‍යාංශයෙන් රු.9,263,000 ක් ගෙවා ලබාගත් පර්චස් 205.42 ක් වූ ඉඩමක් 2011 දෙසැම්බර් 31 දිනට රු.1,540,651 ක් ලෙස අඩු වටිනාකමට තක්සේරු කර ගිණුම් ගතකර තිබුණි.

(ඇ) 2012 දෙසැම්බර් 31 දින වන විටත් ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් ඉඩම් අංක 04 ක් යටතේ වූ එකතුව පර්චස් 419.2 ක ඉඩම්වල වටිනාකම තක්සේරු කර ගිණුම් ගත කර නොතිබූ අතර ,හිමිකම් ඔප්පු ද ආයතනය සතුව නොතිබුණි. එම ඉඩම්වල අයිතිය නිරවුල් කර ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීම සදහා ක්‍රියාකර නොතිබුණි.

(ඈ) නිකුත් කළ වැඩ අධිකාර් වාර්තාව අනුව ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් ඉඩමක් විද්‍යායතනය සතුව නැති බව සහතික කර තිබුණි.මේ පිළිබද විධිමත් පරීක්ෂණයක් කර සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට 2013 ජූනි 28 දින වනවිටත් කටයුතු කර නොතිබුණි.

(ඉ) ඉඩම් අංක 03 ක් යටතේ ස්ථාවර වත්කම් ලේඛනය අනුව ඉඩම්වල ප්‍රමාණයේ එකතුව පර්චස් 967.04 ක් වුවත් වැඩ අධිකාර් වාර්තාව අනුව එහි එකතුව පර්චස් 1967.41 ක් විමෙන් පර්චස් 1000.37 ක වෙනසක් විය. එසේම ස්ථාවර වත්කම් ලේඛනයේ පර්චස් 143.02 ක ඉඩමක් වැඩ අධිකාර් වාර්තාව අනුව පර්චස් 107.76 ක් වූයෙන් පර්චස් 35.26 ක වෙනසක් විය.

4.6 **කාර්ය මණ්ඩල පරිපාලනය**

විගණනය සඳහා ඉදිරිපත් කළ අනුමත කාර්ය මණ්ඩල වාර්තාව හා දැනට විද්‍යායතනයේ තථ්‍ය කාර්ය මණ්ඩලය සැසදීමේ දී පහත පුරප්පාඩු පවතින බව නිරීක්ෂණය විය.

| සේවක වර්ගය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| <u>අනධ්‍යයන</u> | | | |
| ලිපිකාර හා ආශ්‍රිත | 20 | 15 | 05 |
| කණිෂ්ඨ | 17 | 08 | 09 |
| <u>අධ්‍යයන</u> | | | |
| ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ii | 27 | 20 | 07 |
| ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I | 06 | 03 | 03 |
| කථිකාචාර්ය (ආධුනික ) | 04 | 03 | 01 |
| | 74 | 49 | 25 |

මූලික සිද්ධාන්ත අංශය හා චිකිත්සා යන අංශ දෙකෙහි පමණක් අධ්‍යයන කාර්යමණ්ඩලයේ පුරප්පාඩු 13 ක් නිරීක්ෂණය විය.

4.7 **<u>සේවක පාර්තෝෂික සදහා ප්‍රතිපාදන වෙනුවෙන් අරමුදලක් ගොඩනැගීම</u>**

සේවක පාර්තෝෂික සදහා ප්‍රතිපාදන වෙනුවෙන් රු.37, 599,840 ක අරමුදලක් ගොඩනැගීමට කටයුතු කර නොතිබුණි.

5 **<u>ගිණුම් කටයුතුභාවය හා යහපාලනය</u>**

5.1 **<u>ක්‍රියාකාර් සැලැස්ම - 2012</u>**

විද්‍යායතනයේ 2012 වර්ෂය සදහා පිළියෙල කරන ලද ක්‍රියාකාර් සැලැස්මට අනුව වර්ෂය තුළ ඉටු කළ යුතු ප්‍රධාන ක්‍රියාකාරකම් 68 ක් විය. මෙම කාර්යයන් ලහාකර ගැනීම සම්බන්ධයෙන් පිළියෙල කරන ලද විද්‍යායතනයේ ප්‍රගති වාර්තාව අනුව විගණන පරීක්ෂණ වලදී පහත සදහන් කරුණු නිරීක්ෂණය විය.

(අ ) වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ක්‍රියාකාරකම්වලින් වර්ෂය අවසන් වන විටත් ,ආරම්භ නොකළ ව්‍යාපෘති 18 ක් වූ අතර ,වර්ෂය අවසන් වන විට නිම කළ යුතුව තිබුණත් ,එසේ නිම කිරීමට අපොහොසත්ව ප්‍රමාද වී තිබුණු ක්‍රියාකාරකම් 23 ක් විය.

(ආ) ක්‍රියාකාර් සැලැස්මෙහි වූ අපේක්ෂිත ක්‍රියාකාරකම් 68 න් වර්ෂය තුළ සම්පූර්ණයෙන්ම නිමකළ ක්‍රියාකාරකම් 12 ක් පමණක් විය. ඒ අනුව අපේක්ෂිත ක්‍රියාකාරකම් ප්‍රමාණයෙන් වර්ෂය තුළ නිමකර ගැනීමට විද්‍යායතනයට හැකි වී තිබුණේ සියයට 18 ක් පමණි. මේ අනුව ක්‍රියාකාර් සැලැස්මෙහි කාර්යයන් සියයට 80 ට අධික ප්‍රමාණයක් සමාලෝචිත වර්ෂයේ දී ඉටු කර ගැනීමට නොහැකි වී තිබුණි.

5.2 **අයවැය ලේඛනමය පාලනය**

සමාලෝචිත වර්ෂයේ අයවැයගත වියදම් හා තථ්‍ය වියදම් සැසඳීමේදී සියයට 10 සිට සියයට 145 දක්වා පරාසයක ප්‍රමාණාත්මක විචලනයන් වූයෙන් අයවැය ලේඛනය සඵල කලමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කර ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

5.3 **වාර්ෂික වාර්තා සභාගත කිරීම**

2010 සහ 2011 වර්ෂයන්හි වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභා ගත කර නොතිබුණි.

5.4 **නොවිසඳී ඇති විගණන ඡේද පිළිබඳ නිරීක්ෂණ**

2008 වර්ෂයේදී ආයුර්වේද ශික්ෂණ රෝහල ආයුර්වේද දෙපාර්තමේන්තුවට පවරා තිබූ අතර , විද්‍යායතනය විසින් එම රෝහල වෙනුවෙන් ගෙවීම් කර තිබූ රු.1,989,577 ක මුදල සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ප්‍රතිපූර්ණය කර ගෙන නොතිබුණි. එම මුදල ලැබිය යුතු ජල ගාස්තු ලෙස ජංගම වත්කම් යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. පසුගිය විගණන වාර්තාවලින් හා පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී ද මේ පිළිබඳව අවධානය යොමු කර තිබුණද, 2013 ජුනි 28 දින තෙක් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

6. **පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු විද්‍යායතනයේ අධ්‍යක්ෂකවරයාගේ අවධානයට වරින්වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතු වේ.

(අ) ගිණුම්කරණය

(ආ) මූල්‍ය පාලනය

(ඇ) කොන්ත්‍රාත් පරිපාලනය

(ඇ) වත්කම් පාලනය

එච්.ඒ. එස්. සමරවීර

විගණකාධිපති.

**ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය**
**කැළණිය විශ්වවිද්‍යාලය, යක්කල.**
**GAMPAHA WICKRAMARACHCHI AYURVEDA INSTITUTE**
UNIVERSITY OF KELANIYA, YAKKALA.

| | | | | | |
|---|---|---|---|---|---|
| අධ්‍යක්ෂ<br>Director | 033-2222739 | නියෝජ්‍ය ලේඛකාධිකාරි (පාලන)<br>Deputy Registrar (Admin)<br>ෆැක්ස්/Fax | 033-2226 618<br>033-2223784 | නියෝජ්‍ය මූල්‍යාධිකාරි<br>Deputy Bursar<br>ෆැක්ස්/Fax | 033-2223785<br>033-2223785 |
| ෆැක්ස්<br>Fax | 033-2222739 | ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි (විභාග)<br>Senior Assistant Registrar (Exams) | 033-2223784 | සහකාර මූල්‍යාධිකාරි (සැපයුම්)<br>Assistant Bursar (Supplies) | 033-3340105 |
| කාර්යාලය<br>General Office | 033-2222740-2222748<br>033-3340101 | සහකාර ලේඛකාධිකාරි (ශිෂ්‍ය සේවා)<br>Assistant Registrar (Student affairs) | 033-3340106 | ඊ මේල්<br>E-mail | ayurgmp@sltnet.lk |


මගේ අංකය / My Number: ජීඩබ්ඒඅයි/ඒසී4/2012 විගණන

ඔබගේ අංකය / Your Number: ඊසී/එප්/ජීඩබ්ඒඅයි/එෆ්ඒ/2012

දිනය / Date: 2013.10.14

එච්.ඒ.එස්. සමරවීර මහතා,
විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
අංක 306/72 පොල්දුව පාර,
බත්තරමුල්ල.

මහත්මයාණෙනි,

<u>කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (1) උප වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.</u>

ඉහත සඳහන් වාර්තාව සම්බන්ධයෙන් මේ වන විට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ අදහස් මෙසේ දක්වමි.

1.2 <u>මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමණාකරණයේ වගකීම</u>

1.3 <u>විගණකගේ වගකීම</u>

1.4 තත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

2. <u>මූල්‍ය ප්‍රකාශන</u>

2.1 <u>තත්වාගණනය කළ මතය</u>

2.2 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

2.2.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

HETC ව්‍යාපෘතිය තුලින් ලැබුනු පොත් සහ එහි වටිනාකම් ආයතනයේ ස්ථාවර වත්කම් ලේඛනයට සටහන් කර ඒ අනුව ගිණුම් ගත කොට ඇත.

2.2.2 <u>**නොසැසඳූ පාලන ගිණුම්**</u>

(අ) ස්ථාවර වත්කම් ලේඛණයේ මුළු වත්කම්වල වටිනාකම තුලනය වී තිබූ අතර, පැවැති වර්ගීකරණ අඩුපාඩු නිවැරැදිකර සංශෝධිත උප ලේඛන විගණනයට ඉදිරිපත් කර ඇත.

(ආ) ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන ණය ලේඛනයේ ශේෂ පොදු ලෙජරයේ ණය ශේෂ සමග තුලනය වී ඇත.

2.2.3 **ගෙවිය යුතු ගිණුම්**

මේ යටතේ දක්වා තිබූ රඳවා ගැනීම් මුදලින් රු. 469,186/- ක් ද, විවිධ ඇප තැන්පත් මුදලින් රු. 147,950/- ක් ද, නොගෙවූ වව්චර් තැන්පත් මුළු මුදලම ද මේ වන විට නිරවුල් වී ඇති අතර, ශේෂ මුදල් නිරවුල් කිරීමට කටයුතු කෙරේ.

2.2.4 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

කෙරීගෙන යන ඉදිකිරීම් කර්මාන්ත පැහැදිලිව හඳුනාගත හැකි වන පරිදි එක් එක් කොන්ත්‍රාත්තුව සඳහා වෙන වෙනම සටහන් කිරීම් සහිතව ලේඛණයක් පවත්වාගෙන යනු ලැබේ.

2.2.5 **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

(අ) **මුදල් රෙගුලාසි 104 (2)**

මු.රෙ. 104 (2) ප්‍රකාරව ඉදිරියේදී කටයුතු කිරීමට එකඟ වෙමි.

(ආ) **1994 ජූනි 14 දිනැති හා අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය**

සාමාන්‍ය රාජකාරි වලට අමතරව සිදු කෙරෙන බාහිර පාඨමාලා කටයුතු ක්‍රමානුකූලව පවත්වාගෙන යාමේ අරමුණින්, එම කටයුතු වල නිරත වන අධ්‍යයන අනධ්‍යයන කාර්ය මණ්ඩල සඳහා ගෙවීම් සිදු කර ඇති අතර, එම ගෙවීම් ආයතනයේ මුදල් කමිටුව සහ කළමනාකරණ මණ්ඩලය විසින් අනුමත නිර්නායක සහ අයවැය ඇස්තමේන්තු වලට අනුකූලව සිදු කර ඇත.

(ඇ) **2003 ජූනි 02 දිනැති හා අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 6.5.1 ඡේදය**

මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී ඒ සමග වාර්ෂික වාර්තාව (කෙටුම්පත) ඉදිරිපත් කිරීමට එකඟ වෙමි.

(ඈ) **2011 අප්‍රේල් 07 දිනැති අංක 45 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය**

පර්යේෂණ දීමනා ගෙවීමේදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අනුව කටයුතු කරන බව දන්වමි.

3. **මූල්‍ය සමාලෝචනය**

3.1 **මූල්‍ය ප්‍රතිඵල**

4. **මෙහෙයුම් සමාලෝචනය**

4.1 අධ්‍යයන කාර්යසාධනය

පාඨමාලා හැර යාමේ ප්‍රතිශතය අවමකරගැනීම වෙනුවෙන් කටයුතු කෙරෙමින් පවතී.

4.2. මෙහෙයුම් අකාර්යක්ෂමතා

ගාස්තු අයකර පවත්වනු ලබන පාඨමාලා

(අ) ඍජු දුරකථන පහසුකම් සපයා නොමැති සමායෝජක වරුන් වෙත පාඨමාලා කටයුතු

ක්‍රමවත්ව සහ පහසුවෙන් පවත්වාගෙන යාමේ අරමුණින් අනුමත අයවැය ඇස්තමේන්තු වලට අනුව බාහිර පාඨමාලා අරමුදලින් සන්නිවේදන ගාස්තු ගෙවා ඇත.

(ආ) බාහිර පාඨමාලා කටයුතු සංවිධානය කිරීම වෙනුවෙන් (රජයේ නිවාඩු දින) දිනකට රු.5,000/- ක උපරිමයකට යටත්ව පැමිණි දින ගණනට ගෙවීම් සිදු කර ඇත.

4.3 **ආර්ථික නොවූ ගණුදෙනු**

අදාල මුදල් ගෙවීම් සිදුකර ඇති අතර නව දුරකථන පද්ධතිය ලබා ගැනීම වෙනුවෙන් කටයුතු කෙරෙමින් පවතී.

4.4 **හඳුනා ගන්නා ලද අඩුපාඩු**

**භාර නොදුන් පුස්තකාල පොත්**

දැනට ලබාගැනීමට ඉතිරිව ඇති පොත් සංඛ්‍යාව 122 ක් වන අතර එම පොත් ප්‍රමාණය ද ලබා ගැනීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී.

4.5 **විධිමත් පරිදි පවරා නොගත් ඉඩම්**

(අ) අතිගරු ජනාධිපති තුමාගේ අත්සන සහිතව නිදහස් දීමනා පත්‍රයක් යටතේ එම ඉඩම ආයතනය වෙත භාර දී ඇත.

(ආ) ඉදිරිපත්කර තිබූ උපලේඛනයේ මුද්‍රණ දෝෂයක් සිදු වී තිබුණ ද එහි වටිනාකම නිවැරදිව ගිණුම් ගත වී ඇත.

(ඇ), (ඈ), (ඉ) ඉඩම් සම්බන්ධව පවතින අඩුපාඩු හඳුනාගන නිරවුල් කිරීමට කටයුතු යොදා ඇත.

4.6 **කාර්ය මණ්ඩල පරිපාලනය**

දැනට කථිකාචාර්ය (ආධුනික) තනතුරු සඳහා බඳවාගැනීම් දැනටමත් සිදු කර ඇති අතර, අනෙකුත් බඳවා ගැනීම්වලට අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතී.

4.7 **සේවක පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන වෙනුවෙන් අරමුදලක් ගොඩනැගීම**

සේවක පාරිතෝෂික සඳහා වාර්ෂිකව ප්‍රතිපාදන වෙන් කිරීම සිදු කරන අතර, ඒ සඳහා අරමුදලක් ගොඩනැගීම වෙනුවෙන් කටයුතු යොදා ඇත.

5. **ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

5.1 **ක්‍රියාකාරී සැලැස්ම - 2012**

(අ, ආ) වර්ෂය තුල ආයතනය වෙත නිදහස් කෙරෙන මුදල් ප්‍රතිපාදන වලට අනුකූලව ප්‍රමුඛතා පදනම මත ක්‍රියාකාරී සැලැස්මේ කටයුතු ඉටු කර ඇති බව දන්වමි.

5.2 **අයවැය ලේඛනමය පාලනය**

අයවැය ලේඛනය කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කර ගැනීමට කටයුතු කරන බව දන්වමි.

5.3 **වාර්ෂික වාර්තා සභාගත කිරීම**

2010 සහ 2011 වර්ෂයන්හි වාර්ෂික වාර්තා 2013/07/24 දින පාර්ලිමේන්තුව වෙත බාර දී ඇත.

5.4 **<u>නොවිසඳී ඇති විගණන ඡේද පිළිබඳ නිරීක්ෂණ</u>**

මේ සම්බන්ධයෙන් ආයුර්වේද කොමසාරිස් දැනුවත් කර ඇති අතර, එම මුදල් කොටස් වශයෙන් හෝ ලබා දීමට ආයුර්වේද කොමසාරිස් තුමා එකඟත්වය පළකර ඇති බව දන්වමි.

6. **<u>පද්ධති හා පාලනයන්</u>**

විගණනය විසින් දක්වා තිබූ පද්ධති හා පාලන අඩුපාඩු හැකි තරම් දුරට අවම කර ගැනීමට විශේෂ අවධානය යොමු කරන බව දන්වා සිටිමි.

අධ්‍යක්ෂ,
මහාචාර්ය ජනිතා ඒ. ලියනගේ

පිටපත් -

1. උපකුලපති - කැලණිය විශ්වවිද්‍යාලය
2. සභාපති - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
3. ලේකම් - උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
4. ලේකම් - මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය